# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No } 10120

ෆැක්ස්
தொலைநகல
Fax } 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


---

මගේ අංකය
எனது இலக்கம்
My NO } / 2023

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2023

දිනය
திகதி
Date } 23/12/2023
பநய

## මාධ්‍ය නිවේදනය

**නීති විරෝධී ලෙස මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට සැකකරන රුපියල් ලක්ෂ 237 ක් වටිනා දේපල අත්අඩංගුවට - වේයන්ගොඩ පොලිස් ස්ථානය.**

නීති විරෝධී ලෙස මත්ද්‍රව්‍ය ජාවාරමෙන් දේපල උපයා ගන්නා ලද වේයන්ගොඩ පොලිස් වසමේ හීංදෙණිය ප්‍රදේශයේ පදිංචි මත්ද්‍රව්‍ය ජාවාරම්වලට සම්බන්ධ පුද්ගලයෙකු සම්බන්ධයෙන් වේයන්ගොඩ පොලිස් ස්ථානය මඟින් අත්තනගල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර විමර්ශනයක් ආරම්භ කර ඇත.

ඒ අනුව 2023.12.22 වන දින සවස් කාලයේ දී සැකකරු පදිංචිව සිටින හීංදෙණිය ප්‍රදේශයේ නිවස අවට පරීක්ෂා කර සැකකරුගේ හා ඔහුගේ බිරිඳගෙන් ප්‍රකාශ සටහන් කිරීමෙන් අනතුරුව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාරව ඔවුන් සන්තකයේ තිබූ දේපල වන **කාර් රථ 02 ක්, ජීප් රථයක් හා යතුරුපැදි 04 ක්** පොලිස් භාරයට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් දේපල වල වටිනාකම මුදල් රුපියල් ලක්ෂ 237 ක් පමණ වේ. වේයන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**